# තනතුරු පුරප්පාඩු දැන්වීම

## අනුරාධපුර මහා නගර සභාවේ පවත්නා පහත දැක්වෙන තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. බඳවා ගනු ලබන තනතුරු:**

1. සැලසුම් ශිල්පී
2. වැඩ පරිපාලක
3. කාර්මික නිලධාරි (ප්‍රමාණ සමීක්ෂක)
4. රියදුරු (ට්‍රැක්ටර් රථ)

**02. බඳවා ගැනීමේ සුදුසුකම් :**

## 1. සැලසුම් ශිල්පී :

**1. අධ්‍යාපන සුදුසුකම් :**

ව්‍යාවහාර ගණිතය/ශුද්ධ ගණිතය/ සංයුක්ත ගණිතය සහ භෞතික විද්‍යාව/ඉංජිනේරු තාක්ෂණවේදය සහ තාක්ෂණවේදය සඳහා විද්‍යාව සහිතව විද්‍යා/ගණිත/තාක්ෂණවේදය විෂය ධාරාවන්ගෙන් විෂයයන් තුනකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය එකවර සමත් වී තිබීම. සහ

සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය සමත් වී තිබීම.

**2. වෘත්තීය සුදුසුකම් :**

වෘත්තීය ක්ෂේත්‍රයට අදාලව ජාතික වෘත්තීය කුසලතා (NVQ 6) මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම **හෝ**

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක සැලසුම් ශිල්පය පිළිබඳ එක් අවුරුදු පූර්ණකාලීන පුහුණු පාඨමාලාවක් සාර්ථකව හදාරා අදාළ සහතිකය ලබා තිබීම **හෝ**

උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ලද ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව පහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියළු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

**3. වයස් සීමාව :**

වයස අවුරුදු 18 ත් 35 ත් අතර වයස් සීමාව සලකා බලනු ලැබේ.

**4. වැටුප් පරිමාණය :**

උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ, සේවා ව්‍යවස්ථාවේ III ශ්‍රේණිය සඳහා රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 10/2025 හි MN 3 වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප මෙම තනතුරට ලබා දේ.

**5. කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා තනතුරු ප්‍රමාණය :**

**සැලසුම් ශිල්පී - තනතුරු - 01**

## 2. වැඩ පරිපාලක

**1. අධ්‍යාපන සුදුසුකම් :**

සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය සමත් වී තිබීම සහ

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක්වත් සමත් වී තිබීම.

**2. වෘත්තීය සුදුසුකම් :**

වෘත්තීය ක්ෂේත්‍රයට අදාලව ජාතික වෘත්තීය කුසලතා (NVQ 3) මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

**3. වයස් සීමාව :** වයස අවුරුදු 18 ත් 35 ත් අතර වයස් සීමාව සලකා බලනු ලැබේ.

**4. වැටුප් පරිමාණය :**

උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතන වල වැඩ පරිපාලක සේවා ව්‍යවස්ථාවේ III ශ්‍රේණිය සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි MN 1 වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප මෙම තනතුරට ලබාදේ.

**5. කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා තනතුරු ප්‍රමාණය :**

**වැඩ පරිපාලක - තනතුරු - 02**

## 3. කාර්මික නිලධාරි / ප්‍රමාණ සමීක්ෂක

**1. අධ්‍යාපන සුදුසුකම් :**

ක්ෂේත්‍රයට අදාළ විෂයයන් දෙකක් සහිතව විද්‍යා / ගණිත / තාක්ෂණවේදය / විෂය ධාරාවට අයත් විෂයයන් තුනකින් (03) අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය එකවර සමත් වී තිබීම **සහ**

සිංහල /දෙමළ / ඉංග්‍රීසි භාෂාව, ගණිතය හා තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය සමත් වී තිබීම.

**2. වෘත්තීය සුදුසුකම් :**

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක තනතුරට අදාළ ක්ෂේත්‍රයක පාඨමාලාවක් සාර්ථකව හදාරා ජාතික තාක්ෂණ සහතිකය ලබා තිබීම (ජාතික තාක්ෂණ සහතිකය සිවිල්/විදුලි/යාන්ත්‍රික) හෝ

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක කර්මාන්ත තාක්ෂණිකයින් සඳහා වූ ජාතික සහතික පත්‍ර පාඨමාලාවක් සාර්ථකව හදාරා අදාළ සහතිකය ලබා තිබීම **හෝ**

උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ලද ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව පහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියලූ අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

**3. වයස් සීමාව :**

වයස අවුරුදු 18 ත් 35 ත් අතර වයස් සීමාව සලකා බලනු ලැබේ.

**4. වැටුප් පරිමාණය :**

උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ, සේවා ව්‍යවස්ථාවේ III ශ්‍රේණිය සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි MN 3 වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප මෙම තනතුරට ලබා දේ.

**5. කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා තනතුරු ප්‍රමාණය :**

**කාර්මික නිලධාරි / ප්‍රමාණ සමීක්ෂක - තනතුරු - 01**

## 4. රියදුරු (ට්‍රැක්ටර් රථ)

**1. අධ්‍යාපන සුදුසුකම් :**

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සිංහල /දෙමළ භාෂාව ඇතුළුව සම්මාන සාමාර්ථයන් දෙකක් සහිතව විෂයයන් හයකින් (06) සමත් වී තිබීම.

**2. වෘත්තීය සුදුසුකම් :**

බර වාහන පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ මෝටර් රථ පැදවීමේ වලංගු බලපත්‍රයක් ලබා තිබීම.

මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතු ය.

බර වාහන රියදුරකු වශයෙන් වසර තුනක (03) පළපුරුද්දක් ලබා තිබිය යුතු අතර, පළපුරුද්ද සහතික මගින් සනාථ කළයුතු වේ.

**3. වයස් සීමාව :**

වයස අවුරුදු 18 ත් 35 ත් අතර වයස් සීමාව සලකා බලනු ලැබේ.

**4. කායික සුදුසුකම් :**

සෑම අපේක්ෂකයෙකුම දිවා කාලයේ සහ රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතුය. රජයේ වෛද්‍ය නිලධාරි විසින් නිකුත් කරන ලද විධිමත් සහතිකයක් මගින් ඒ බව සනාථ කළ යුතුය.

අවම උස අඩි 5 යි අඟල් 2 1/2 ක් විය යුතුය.

**5. වැටුප් පරිමාණය :**

උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරන් සඳහා වන සේවා ව්‍යවස්ථාවේ III ශ්‍රේණිය සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි PL3 වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප මෙම තනතුරට ලබා දේ.

**6. කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා තනතුරු ප්‍රමාණය :**

**රියදුරු - තනතුරු - 04**

**පොදු කොන්දේසි :**

**04. කායික සුදුසුකම් :**

සෑම අපේක්ෂකයෙකුම උතුරු මැද පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

**05. වෙනත් සුදුසුකම් :**

අයදුම්පත්‍ර භාර ගන්නා අවසන් දිනට, පූර්වාසන්න වසර තුන (03) ක් උතුරු මැද පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය. පදිංචි වසමේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද සහතිකය මත අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර නිකුත් කරන ලද ලියවිල්ලකින් පදිංචිය සනාථ කළ යුතු ය.

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට සියලූ සුදුසුකම් සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

**06. බඳවා ගැනීමේ ක්‍රමය :**

අයදුම්පත් පරීක්ෂා කිරීමෙන් පසු සුදුසුකම් ඇති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලැබූවන් තනතුරට බඳවා ගනු ලැබේ.

**07. අයදුම්පත් ඉදිරිපත් කිරීම :**

මේ සමග අමුණා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය. අයදුම්පත් නිවැරදිව හා පැහැදිලිව තම අත් අකුරින්ම සම්පූර්ණ කළයුතු වේ. A4 ප්‍රමාණයේ කඩදසි වල අයදුම්පත්‍රය පිළියෙල කළ යුතු ය. අයදුම්පත 2025.09.16 දිනට පෙර ලැබෙන සේ නාගරික කොමසාරිස්, මහා නගර සභාව, අනුරාධපුර යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුවේ.

08. නිසි පරිදි සම්පූර්ණ කර නොමැති අයදුම්පත් හා මූලික සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

09. මෙම තනතුරු සඳහා බඳවා ගැනීම හෝ නොගැනීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව සම්බන්ධ අවසාන තීරණය අනුරාධපුර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතු වේ.

10. ඉහත තනතුරු සඳහා බඳවා ගනු ලබන්නේ හුදෙක්ම කොන්ත්‍රාත් පදනම මත මහා සභාව විසින් තීරණය කරනු ලබන කාලසීමාවකට පමණි.

11. සේවා අවශ්‍යතාවය මත එම කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම හෝ අඩු කිරීමට සිදු විය හැකිය.

**නාගරික කොමසාරිස්,**
**මහා නගර සභාව,**
**අනුරාධපුර.**
**2025.08.25 දින**

**අනුරාධපුර මහා සභා**
**කාර්යාලයේ දී ය.**

**(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)**

## ආදර්ශ අයදුම්පත

**අනුරාධපුර මහා නගර සභාවේ .................. තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම**

01. සම්පූර්ණ නම : ...........................................
02. පෞද්ගලික ලිපිනය : ...........................................
03. ජාතික හැඳුනුම්පත් අංකය : ...........................................
04. උපන් දිනය : ...........................................
05. 202 ........................... දිනට වයස : ...........................
06. දුරකථන අංක : ජංගම : ........................... ස්ථාවර : ...........................
07. අධ්‍යාපන සුදුසුකම් :

**අ.පො.ස. (සා.පෙළ)**

| | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| 01. | .................. | .................. |
| 02. | .................. | .................. |
| 03. | .................. | .................. |
| 04. | .................. | .................. |
| 05. | .................. | .................. |
| 06. | .................. | .................. |
| 07. | .................. | .................. |
| 08. | .................. | .................. |

**අ.පො.ස. (උසස් .පෙළ)**

| | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| 01. | .................. | .................. |
| 02. | .................. | .................. |
| 03. | .................. | .................. |
| 04. | .................. | .................. |

08. වෘත්තීය සුදුසුකම් : ...........................................
09. පළපුරුද්ද : ...........................................
10. අයදුම්කරුගේ සහතිකය :

ඉහත නම් සඳහන් මා විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යැයි සොයා ගනු ලැබුවහොත් මා විසින් ඉල්ලුම් කර ඇති ඉහත තනතුරට පත් කිරීම සඳහා වූ මාගේ හිමිකම් නොසලකා හරිනු ලැබීමට ද හැකි බව ද දනිමි.

දිනය : ..........................

..........................
අයදුම්කරුගේ අත්සන